14452

AL/2021(2022)/28/S-I

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2021(2022)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2021(2022)
General Certificate of Education (Adv. Level) Examination, 2021(2022)

| | | |
|---|---|---|
| ගෘහ ආර්ථික විද්‍යාව I<br>மனைப் பொருளியல் I<br>Home Economics I | 28 S I | පැය දෙකයි<br>இரண்டு மணித்தியாலம்<br>*Two hours* |

**උපදෙස්:**

- ※ **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- ※ උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
- ※ උත්තර පත්‍රයේ පිටුපස දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
- ※ **1** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ** පිළිතුර තෝරාගෙන, එය **උත්තර පත්‍රයේ පසුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක්** (X) **යොදා දක්වන්න.**

**1.** නිර්මාණකරණයේදී නම්‍යශීලී හැඟීමක් ඇති කළහැකි රේඛා වර්ගය මින් කුමක් ද?
(1) වක්‍ර රේඛා (2) තිරස් රේඛා (3) සිරස් රේඛා
(4) අක්වක් රේඛා (5) විකර්ණාකාර රේඛා

**2.** ගොඩනැගිලි හා අවට පරිසරය නිර්මාණකරණය හා සම්බන්ධ 'සංකල්පය' අයත් වනුයේ මින් කුමකට ද?
(1) ප්‍රමිති (2) මූලිකාංග (3) මූලධර්ම
(4) මූලික සාධක (5) උපයෝගිතා සාධක

**3.** මේ අතුරෙන් හරිත තිරසාර නිවසක් සඳහා **නුසුදුසු** වන්නේ කුමක් ද?
(1) විද්‍යුත් ශක්තිය වෙනුවට සූර්ය බලශක්තිය භාවිත කිරීම
(2) වැසි ජලය රැස් කර, ගෙවතු වගාව සඳහා යොදා ගැනීම
(3) LED විදුලි පහන් වෙනුවට සූත්‍රිකා සහිත විදුලි පහන් භාවිත කිරීම
(4) විදුලි පංකා ක්‍රියා කරවීම වෙනුවට ජනේල විවෘතව තැබීම
(5) කෘත්‍රිම ආලෝකය වෙනුවට ස්වභාවික ආලෝකය ලබා ගැනීම

**4.** නිර්මාණකරණය පිළිබඳ නිවැරදි ප්‍රකාශය කුමක් ද?
(1) වර්ණයක ලා සහ තද බව එහි තීව්‍රතාව ලෙස හැඳින්වේ.
(2) දිග, පළල හා දෘෂ්‍ය බර ආදිය එකිනෙකට ගැළපීම සමෝධානය නම් වේ.
(3) එකම ලක්ෂණය නැවත නැවත වක්‍රාකාරව දැක්වීම ආසාත්මක රිද්මය නම් වේ.
(4) ක්‍රියානුරූපී බව ඇති කිරීමේදී උචිත බව කෙරෙහි අවධානය යොමු කළ යුතු ය.
(5) නූතන සංකල්පයට අනුව ගොඩනැගිලි සඳහා සංකීර්ණ ජ්‍යාමිතික හැඩතල යොදා ගනියි.

**5.** කාබෝහයිඩ්‍රේට් හා සම්බන්ධ නිවැරදි ප්‍රකාශය කුමක් ද?
(1) ග්ලූකෝස් සහ ලැක්ටෝස් සරල සීනි වර්ග වේ.
(2) ධාන්‍යවල මෝල්ටෝස් සහ සුක්‍රෝස් අඩංගු ය.
(3) හයිඩ්‍රජන් සහ ඔක්සිජන් අතර අනුපාතය 1:2 කි.
(4) ඇමයිලෝස් සහ සෙලියුලෝස් පොලිසැකරයිඩ වේ.
(5) ෆෘක්ටෝස් සහ ගැලැක්ටෝස්වල සමාන ව්‍යුහ සූත්‍ර ඇත.

**6.** ආහාර කාණ්ඩවල පෝෂණ අගය පිළිබඳ කරුණු කිහිපයක් පහත දැක්වේ.
P - විටමින් D සහ E අඩංගු ය.
Q - විටමින් C සහ තන්තු සපයන ප්‍රභවයකි.
R - සිරුරට බීටා කැරොටීන් ලබා දේ.
S - සිත්ක් සහ සයනොකොබෝල්ඇමීන්වලින් සරු ය.

මේවා අතුරෙන් පලතුරු කාණ්ඩයට අදාළ කරුණු වනුයේ,
(1) P සහ R පමණි. (2) P සහ S පමණි. (3) Q සහ R
(4) Q සහ S පමණි. (5) R සහ S පමණි.

[දෙවැ

**7.** සිරුරෙහි අඩංගු මේද පිළිබඳ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) ස්නායු සෛලවල සංඝටකයකි.
(2) සමහර එන්සයිම සහ හෝමෝනවල සංඝටකයකි.
(3) විටමින් A සහ C අවශෝෂණය සඳහා අවශ්‍ය වේ.
(4) ආමාශයික යුෂයෙහි අඩංගු ලයිපේස් මගින් ජීර්ණය සිදු වේ.
(5) අතිරික්ත මේද අක්මාව තුළ ග්ලයිකොජන් ලෙස ගබඩා කරයි.

**8.** පහත කරුණු සලකන්න.
- ප්‍රතිඔක්සිකාරකයකි.
- තුවාල සුවවීමට උපකාරී වේ.
- ප්‍රතිශක්තිය ලබා දේ.
- යකඩ අවශෝෂණය පහසු කරයි.

මෙම කරුණු සියල්ලටම සම්බන්ධ විටමිනය වනුයේ,
(1) විටමින් A ය. (2) විටමින් $B_1$ ය. (3) විටමින් C ය.
(4) විටමින් D ය. (5) විටමින් E ය.

**9.** කැල්සියම් ඌනතාව හා සම්බන්ධ නිවැරදි ප්‍රකාශය කුමක් ද?
(1) වයස්ගත පිරිමි අතර සුලභ තත්ත්වයකි.
(2) ශ්‍රී ලංකාවේ ඉතා බහුලව පවත්නා තත්ත්වයකි.
(3) පොස්පරස් සහ විටමින් A ඌනතාව ද මෙයට බලපායි.
(4) ආර්තවහරණයෙන් පසුව ඇතිවන මෙම ඌනතාව ඔස්ටියොමැලේෂියාව ලෙස හැඳින්වේ.
(5) මේ නිසා ඇති වන අස්ථි විකෘති රෝගයේදී අස්ථි සිහින් වීම සහ ඇවිදීම පමාවීම පෙන්නුම් කරයි.

**10.** පෝෂ්‍ය පදාර්ථවල කෘත්‍ය කිහිපයක් පහත දක්වා ඇත.
A - සිරුර තුළ ඔක්සිජන් පරිවහනය කිරීම.
B - සමෙහි නිරෝගිතාව පවත්වා ගැනීම.
C - මතක ශක්තිය වර්ධනය කිරීම.
D - ගර්භණී සමයේ සංකූලතා අවම කිරීම.
E - සිරුරෙහි විද්‍යුත් විච්ඡේද්‍ය තුලනය පාලනය කිරීම.

මේවා අතුරෙන් යකඩවල කෘත්‍ය වන්නේ,
(1) A සහ B පමණි. (2) B සහ D පමණි.
(3) A , B සහ E පමණි. (4) A, C සහ D පමණි.
(5) C, D සහ E පමණි.

**11.** අයඩින් ඌනතාව නිසා ඇති විය හැකි රෝග ලක්ෂණය කුමක් ද?
(1) විදුරුමස්වලින් ලේ ගැලීම (2) සිරුර සුදුමැලි වීම
(3) බුද්ධි වර්ධනයට බාධා ඇති වීම (4) දෘෂ්ටිය අපැහැදිලි වීම
(5) හිසකෙස් ගැලවී යෑම

**12.** ඔමේගා-3 මේද අම්ල පිළිබඳ නිරවද්‍ය ප්‍රකාශය තෝරන්න.
(1) සිරුර තුළ නිපදවා ගත හැකි ය.
(2) ශාකමය ප්‍රභවවල බහුලව අඩංගු ය.
(3) සංතෘප්ත මේද අම්ල ගණයට අයත් ය.
(4) රුධිර කොලෙස්ටරෝල් මට්ටම අඩු කිරීමට ක්‍රියා කරයි.
(5) ලිනොලීක් අම්ලය හා ලිනොලෙනික් අම්ලය මේ සඳහා උදාහරණ වේ.

**13.** ආමාශයික ප්‍රදාහය ඇති කිරීමට හේතුවිය හැකි ක්ෂුද්‍රජීවී විශේෂය කුමක් ද?
(1) ඇස්පජිලස් ඔරයිසේ (*Aspergillus oryzae*)
(2) එස්චෙරීෂියා කෝලයි (*Eschericia coli*)
(3) ඇසිටොබැක්ටර් ඇසිටයි (*Acetobacter aceti*)
(4) හෙලිකොබැක්ටර් පයිලෝරි (*Helicobacter pylori*)
(5) ස්ට්‍රෙප්ටොකොකස් ලැක්ටිස් (*Streptococcus lactis*)

**14.** එක්තරා බෝ නොවන රෝගයක සංකූලතා කිහිපයක් පහත දැක්වේ.
- ඇසෙහි දෘෂ්ටිවිතානයට හානි වීම
- ස්නායු පද්ධතියට බලපෑම් ඇති වීම
- දෙපාවල සංවේදීතාව අඩු වීම

මෙම රෝගය වන්නේ,
(1) ආඝාතයයි.
(2) දියවැඩියාවයි.
(3) හෘදයාබාධයයි.
(4) ස්ථූලතාවයයි.
(5) අධි රුධිර පීඩනයයි.

More Past Papers at
tamilguru.lk

**15.** මල බද්ධයෙන් පෙළෙන පුද්ගලයකුට වඩාත් සුදුසු ආහාරවේල කුමක් ද?
(1) බත්, පරිප්පු කරිය, බණ්ඩක්කා බැදුම, මස් කරිය සහ බටු මෝජු
(2) බත්, පිපිඤ්ඤා කරිය, දෙල් මැල්ලුම, කැරට් ව්‍යංජනය සහ කරවල බැදුම
(3) බත්, මාලු කිරට, පොළොස් කරිය, මාලුමිරිස් බැදුම සහ තක්කාලි සලාදය
(4) බත්, මුරුංගා කරිය, මාලු මිරිසට, මුකුණුවැන්න මැල්ලුම සහ කොහිල සලාදය
(5) බත්, අර්තාපල් කරිය, හාල්මැස්සන් බැදුම, ගෝවා ව්‍යංජනය සහ පොල් සම්බෝලය

**16.** ජීර්ණ පද්ධතිය තුළදී, පොලිසැකරයිඩ ඩයිසැකරයිඩ බවටත්, ඉන් අනතුරුව ඩයිසැකරයිඩ මොනොසැකරයිඩ බවටත් බිඳ හෙලන එන්සයිම දෙක පිළිවෙළින්,
(1) සුක්රේස් සහ ලැක්ටේස් ය.
(2) ඇමයිලේස් සහ මෝල්ටේස් ය.
(3) මෝල්ටේස් සහ සුක්රේස් ය.
(4) පෙප්ටිඩේස් සහ ලැක්ටේස් ය.
(5) ඇමයිලේස් සහ පෙප්ටිඩේස් ය.

**17.** ක්ෂුද්‍ර තරංග උඳුන මගින් ආහාර පිසීම/එහි ක්‍රියාකාරිත්වය සම්බන්ධ ප්‍රකාශ කිහිපයක් පහත දක්වා ඇත. ඒවායින් **සාවද්‍ය** ප්‍රකාශය තෝරන්න.
(1) අධි සංඛ්‍යාත ක්ෂුද්‍ර තරංග මගින් ක්‍රියා කරයි.
(2) තාප සංක්‍රාමණය සිදුවන්නේ විකිරණය මගිනි.
(3) ආහාරය පිටත සිට මධ්‍යය දක්වා පිසීම සිදු වේ.
(4) පිසූ ආහාර නැවත රත්කර ගැනීමට ද යොදා ගනියි.
(5) අධි ශීතකරණයෙන් පිටතට ගත් ආහාරවල අයිස් ඉවත් කිරීමට භාවිත කරයි.

**18.** මේවායින් කිරි සහ බිත්තර යන දෙවර්ගයම යොදා සකස් කරගන්නා අතුරුපස වර්ග දෙක වනුයේ,
(1) කැරමල් පුඩිම සහ පාන් පුඩිම ය.
(2) වටලප්පන් සහ චොකලට් මූස් ය.
(3) චොකලට් මූස් සහ කැරමල් පුඩිම ය.
(4) මාශ්මෙලෝ පුඩිම සහ වටලප්පන් ය.
(5) පාන් පුඩිම සහ මාශ්මෙලෝ පුඩිම ය.

**19.** සුවඳ කාරකයක් සහ තෙලෝදකාරකයක් වනුයේ පිළිවෙළින්,
(1) ග්ලයිකෝල් සහ ප්‍රොපිලීන් ය.
(2) ලෙසිතීන් සහ ඊතයිල් බියුටිරේට් ය.
(3) ඊතයිල් බියුටිරේට් සහ ග්ලයිකෝල් ය.
(4) ප්‍රොපිලීන් සහ මොනොසෝඩියම් ග්ලූටැමේට් ය.
(5) මොනොසෝඩියම් ග්ලූටැමේට් සහ ලෙසිතීන් ය.

**20.** ආහාර පරිරක්ෂණය සඳහා භාවිත වන ශීතනය ක්‍රියාවලිය පිළිබඳව සිසුන් ඉදිරිපත් කළ කරුණු කිහිපයක් පහත දැක්වේ.

A - ආහාරය අවට පරිසරයෙහි උෂ්ණත්වය 8°C ලෙස පවත්වා ගනියි.
B - ආහාරවල ඇති එන්සයිම සම්පූර්ණයෙන්ම අක්‍රිය වේ.
C - සචල ජලයෙහි ක්‍රියාකාරීත්වය අඩාල වේ.
D - බිත්තර, පලතුරු, එළවළු සඳහා සුදුසු ය.

මින් නිවැරදි කරුණු වනුයේ,

(1) A සහ B පමණි. (2) A සහ D පමණි. (3) B සහ C පමණි.
(4) B සහ D පමණි. (5) C සහ D පමණි.

**21.** සෝර්බේට් සහ සල්ෆයිට් යන රසායනික සංයෝග භාවිත කරමින් පරිරක්ෂණය කරනු ලබන ආහාර වනුයේ පිළිවෙළින්,

(1) ජෑම් සහ චීස් ය. (2) රසකැවිලි සහ පලතුරු පල්ප ය.
(3) ජෑම් සහ රසකැවිලි ය. (4) සිසිල් බීම සහ පලතුරු පල්ප ය.
(5) සිසිල් බීම සහ චීස් ය.

**22.** ආහාර ඇසුරුම් ද්‍රව්‍යයක් ලෙස භාවිත කරනු ලබන ඝනත්වය අඩු පොලිතීන් පිළිබඳ නිවැරදි ප්‍රකාශය කුමක් ද?

(1) ජල පාරගම්‍යතාව අඩු ය.
(2) නැවත නැවත භාවිත කළ හැකි ය.
(3) තෙල් සහිත ආහාර සඳහා සුදුසු වේ.
(4) පොලි ප්‍රොපිලීන් මේ සඳහා උදාහරණයකි.
(5) මයික්‍රෝන් 20ට වඩා වැඩි ඝනකමකින් යුක්ත විය යුතු ය.

**23.** කෙඳි වර්ගීකරණයට අනුව නිවැරදි ප්‍රකාශය මින් කුමක් ද?

(1) රන් සහ රිදී ඛනිජමය කෙඳි වර්ග දෙකකි.
(2) සත්ත්වමය කෙඳි, ප්‍රෝටීන් කෙඳි වර්ග වේ.
(3) ඇස්බැස්ටෝස් මිනිසා විසින් නිෂ්පාදිත කෙන්දකි.
(4) නයිලෝන්, පොලිඑතිලීන් කාණ්ඩයේ කෘත්‍රිම කෙන්දකි.
(5) සෙලියුලෝස්, පුනර්ජනිත කෙඳිවල අනිවාර්ය සංඝටකයකි.

**24.** මැසීමේ ශිල්පීය ක්‍රම දෙකකි,

(1) වාටි මැස්ම සහ බඳන යෙදීම.
(2) වාටි මැස්ම සහ රේන්ද ඇල්ලීම.
(3) රේන්ද ඇල්ලීම සහ බඳන යෙදීම.
(4) සිහින් නූල් දුවවීම සහ වාටි මැස්ම.
(5) බඳන යෙදීම සහ සිහින් නූල් දුවවීම.

**25.** කෙඳි වර්ග දෙකක දික්කඩ පෙනුම A සහ B රූපවලින් දක්වා ඇත.


A


B


මෙම කෙඳි වර්ග වනුයේ පිළිවෙළින්,


(1) ලෝම සහ ලිනන් ය. (2) ලිනන් සහ කපු ය.
(3) නයිලෝන් සහ ලෝම ය. (4) පොලිඑස්ටර් සහ කපු ය.
(5) පොලිඑස්ටර් සහ නයිලෝන් ය.

**26.** කෙඳි වර්ග දෙකක් මිශ්‍රකර නිෂ්පාදිත රෙදි නියැදියක් පිළිස්සූ විට අළු පැහැති (grey colour) අළු සහ කුඩුවන සුළු ප්ලාස්ටික් පබළු මෙන් දිස් වූ ද්‍රව්‍ය ඉතිරි විය. මෙම නියැදියේ අඩංගු කෙඳි වර්ග දෙක වනුයේ,

(1) කපු සහ සේද ය.
(2) කපු සහ නයිලෝන් ය.
(3) නයිලෝන් සහ සේද ය.
(4) කපු සහ සෙලියුලෝස් ඇසිටේට් ය.
(5) සේද සහ සෙලියුලෝස් ඇසිටේට් ය.

**27.** වියමන් වර්ග දෙකක රූප සටහන් පහත දැක්වේ.


A


B

ඉහත A සහ B රූප සටහන්වලින් දක්වා ඇත්තේ පිළිවෙළින්,

(1) චාම් වියමන සහ ජටා වියමන ය.
(2) ජටා වියමන සහ චාම් වියමන ය.
(3) සැටින් වියමන සහ දික්දාර වියමන ය.
(4) සරල හීරි වියමන සහ දික් දාර වියමන ය.
(5) සැටින් වියමන සහ සරල හීරි වියමන ය.

**28.** රෙදි මසර කිරීම හා සම්බන්ධ නිවැරදි ප්‍රකාශය කුමක් ද?

(1) ශක්තිමත් බව වැඩි කරයි.
(2) රෙදිවල අව පැහැය ඉවත් කරයි.
(3) හයිඩ්‍රජන් පෙරොක්සයිඩ් භාවිත කරයි.
(4) කපු සහ ලිනන් කෙඳි සඳහා යෝග්‍ය වේ.
(5) සායම් කෙරෙහි අඩු ඇල්මක් ඇත.

**29.** රෙදි සහ නිමි ඇඳුම් යන දෙවර්ගය සඳහාම යොදනු ලබන නිමාවක් වන්නේ මින් කුමක් ද?

(1) වැලි ඉසීම (2) විරංජනය (3) මලහරණය
(4) කෙඳි පිළිස්සීම (5) සැන්ෆරයිස් කිරීම

**30.** පුද්ගල අවශ්‍යතා සඳහා ඇඳුම් නිර්මාණයේදී භාවිත කරන රෙදි වර්ගවල ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ.

A - සුදු පැහැති රෙදි
B - දික් අතට මෝස්තර යෙදූ රෙදි
C - තද පැහැති රෙදි
D - දීප්තිමත් වර්ණ යෙදූ මෝස්තර සහිත රෙදි

මේ අතුරෙන් පුළුල් සිරුරක් ඇති යෞවනියකට සුදුසු රෙදිවල ලක්ෂණ වන්නේ,

(1) A සහ B පමණි.
(2) A සහ D පමණි.
(3) B සහ C පමණි.
(4) B සහ D පමණි.
(5) C සහ D පමණි.

**31.** ඔබ හා ඔබගේ ගුරුතුමිය අතර සන්නිවේදනය සිදුවන ආකාර තුනක් පහත දැක්වේ.

A - පන්ති කාමරයේදී තොරතුරු සාකච්ඡා කිරීම

B - ජංගම දුරකථනයෙන් කෙටි පණිවිඩ මගින් අදහස් හුවමාරු කිරීම

C - පන්ති කාමරයේදී ගැටලුවක් මතු වුවහොත් අත එසවීම

ඉහත අවස්ථාවලට අදාළ සන්නිවේදන ක්‍රම වනුයේ පිළිවෙළින්,

(1) අවාචික, වාචික සහ ලිඛිත ය.
(2) වාචික, අවාචික සහ ලිඛිත ය.
(3) වාචික, ලිඛිත සහ අවාචික ය.
(4) අවාචික, ලිඛිත සහ වාචික ය.
(5) ලිඛිත, වාචික සහ අවාචික ය.

**32.** පහත සඳහන් සිද්ධීන් අතුරෙන් 'සංසන්දි කතිකාවත' පෙන්නුම් කරනුයේ කුමක් ද?

(1) පන්ති නායකයාගේ අණ, අන් අය පිළිපැදීම
(2) වැඩි පිරිසකගේ මතයට අන් අය අවනත වීම
(3) විරුද්ධ මත ඇති දෙපිරිසක් එකඟතාවයකට පැමිණීම
(4) සිසුන් දෙදෙනෙකුගේ ගැටුමක් ගුරුවරයා මැදිහත් වී විසඳීම
(5) කණ්ඩායමක සාමාජිකයින්ගේ මතයට නායකයා විරුද්ධ වීම

**33.** සංචරණයේ ධනාත්මක ආර්ථික බලපෑමක් වනුයේ,

(1) ප්‍රාදේශීය සංවර්ධනයයි.
(2) ආර්ථිකයේ කාන්දු වීමයි.
(3) සංස්කෘතික වාණිජකරණයයි.
(4) යැපීම් මානසිකත්වය වර්ධනයයි.
(5) භාණ්ඩ හා සේවාවල මිල වැඩි වීමයි.

**34.** මේ අතුරෙන් සංචරණය පිළිබඳ සත්‍ය ප්‍රකාශය කුමක් ද?

(1) ස්වභාවධර්ම සංචරණය රුදෙස් සංචරණය නමින් ද හඳුන්වයි.
(2) විකල්ප සංචරණය මගින් නව්‍ය අත්දැකීම් ලබා ගැනීමට හැකි වේ.
(3) අභ්‍යන්තර සංචරණය රටක නේවාසික ආගන්තුකයින්ට පමණක් සීමා වේ.
(4) කිමිදීම සහ මුහුදු සුළං පහස විඳීම ප්‍රයාන සංචරණයට අයත් ක්‍රියාකාරකම් දෙකකි.
(5) ගොවිපොළක් තුළ නේවාසිකව ගත කිරීම ස්වභාවධර්ම සංචරණයට උදාහරණයකි.

**35.** පුද්ගලයෙක් තම විවේක කාලය ක්‍රීඩා කිරීම හා සංගීතයට සවන් දීම සඳහා යොදා ගනියි. එම විවේකයන් හඳුන්වන්නේ පිළිවෙළින්,

(1) සමාජීය විවේකය සහ ක්‍රියාශීලී විවේකය ලෙස ය.
(2) සමාජීය විවේකය සහ භෞතික විවේකය ලෙස ය.
(3) ක්‍රියාශීලී විවේකය සහ භෞතික විවේකය ලෙස ය.
(4) ක්‍රියාශීලී නොවන විවේකය සහ සමාජීය විවේකය ලෙස ය.
(5) භෞතික විවේකය සහ ක්‍රියාශීලී නොවන විවේකය ලෙස ය.

**36.** සංචාරක කර්මාන්තය හා සම්බන්ධ **වැරදි** ප්‍රකාශය කුමක් ද?

(1) සංචාරක බංගලා ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය යටතේ ලියාපදිංචි කළ යුතු ය.
(2) වර්ෂ 2016 වනවිට ශ්‍රී ලංකාවේ සමස්ත සංචාරක ප්‍රවාහයෙන් 16%ක් ඉන්දියානුවන් ය.
(3) රක්ෂණ ආයතන මගින් සංචාරක කර්මාන්තයට අදාළ උපකාරක සේවාවන් සපයනු ලැබේ.
(4) විවිධ තේමා පසුබිම් කරගත් බුටික් (boutique) හෝටල්, ආදේශක නවාතැන් අංශයට අයත් ය.
(5) වර්ෂ 2015දී ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයේ දෙවන විශාලතම ප්‍රභවය චීනය ලෙස වාර්තා විය.

**37.** නිදන කාමරයක ඇති 15 W විදුලි පහනක් දිනකට පැය 3ක් දල්වා තිබේ නම්, මෙම බල්බය සඳහා සතියකට වැය වන වොට් පැය ගණන කොපමණ ද?

(1) 205 (2) 220 (3) 305 (4) 315 (5) 325

**38.** සම්මත ආකාරයට අනුව පේනුවකට සම්බන්ධ කර ඇති නිල් හා දුඹුරු වර්ණ රැහැන්වලින් නිරූපණය වන්නේ පිළිවෙළින්,

(1) උදාසීන රැහැන සහ සජීවී රැහැන ය.
(2) සජීවී රැහැන සහ භූගත රැහැන ය.
(3) භූගත රැහැන සහ උදාසීන රැහැන ය.
(4) උදාසීන රැහැන සහ භූගත රැහැන ය.
(5) භූගත රැහැන සහ සජීවී රැහැන ය.

**39.** ඔබගේ මාසික ජල බිල්පතෙහි ජල පරිභෝජනය ඒකක 20ක් ලෙස සඳහන් වේ නම්, ඔබ පරිභෝජනය කර ඇති ජල ප්‍රමාණය ලීටර්

(1) 200 කි. (2) 2 000 කි. (3) 5 000 කි. (4) 10 000 කි. (5) 20 000 කි.

**40.** මේ අතුරෙන් නාන කාමරයෙන් පිටවන ජලය බැහැර කිරීමේදී යොදා ගතහැකි සුදුසුම ක්‍රමය කුමක් ද?

(1) ගෙවත්තේ ශාක සඳහා භාවිත කිරීම
(2) පළමුව තෙල් හබකක් වෙත යොමු කිරීම
(3) කෙලින්ම පූතික ටැංකියකට මුදා හැරීම
(4) පළමුව පෙගවුම් ක්ෂේත්‍රයකට යොමු කිරීම
(5) නිවසේ අනෙකුත් සේදීම් කටයුතු සඳහා රැස් කිරීම

**41.** ආහාර පා සලකුණු අවම කරගැනීමට ගතහැකි පියවරක් වන්නේ,

(1) සැකසූ ආහාර පරිභෝජනයට යොමු වීමයි.
(2) පිසීම සඳහා මැටි භාජන භාවිතය අවම කිරීමයි.
(3) පිසූ ආහාර ශීතකරණය තුළ රැස්කර තබා ගැනීමයි.
(4) ආහාර ද්‍රව්‍ය එකවර ගබඩා කර ගැනීමට යොමු වීමයි.
(5) ගව මස්, ඌරු මස් වැනි මස් වර්ග පරිභෝජනය අවම කිරීමයි.

**42.** ජෛව ක්‍රියාකාරී සංයෝගයක් වන ප්‍රී-බයොටික් සම්බන්ධ නිවැරදි වරණය කුමක් ද?

(1) කිරි නිෂ්පාදනවල අඩංගු වේ.
(2) පැසීම සිදු කිරීමට හේතු වේ.
(3) ප්‍රතිශක්තිය ලබාදීමට ආධාර වේ.
(4) මිනිස් සිරුර තුළ ද ජීරණය වේ.
(5) ලැක්ටික් අම්ල බැක්ටීරියා මෙයට උදාහරණයකි.

**43.** නිවසේ එක්රැස්වන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා සුදුසු පියවරක් වන්නේ,

(1) දිනපතා පුළුස්සා දැමීමයි.
(2) විවෘත කානුවල රැස් කිරීමයි.
(3) කොම්පෝස්ට් නිෂ්පාදනය කිරීමයි.
(4) ද්‍රව අපද්‍රව්‍ය ගෙවත්තට මුදා හැරීමයි.
(5) සනීපාරක්ෂක භූ පිරවුම් සඳහා යොදා ගැනීමයි.

**44.** ප්‍රතිචක්‍රීකරණය කළ **නොහැකි** සම්පත් පමණක් අඩංගු වරණය කුමක් ද?

(1) සම්, දැව සහ ජෛව ස්කන්ධ
(2) සම්, ජෛව ස්කන්ධ සහ ගල් අඟුරු
(3) ජෛව ස්කන්ධ, සම් සහ පෙට්‍රෝලියම් සංයෝග
(4) දැව, පෙට්‍රෝලියම් සංයෝග සහ ලෝහමය ඛනිජ
(5) ගල් අඟුරු, පෙට්‍රෝලියම් සංයෝග සහ ලෝහමය ඛනිජ

**45.** නව යොවුන්වියේ සමස්ත සංවර්ධනය සලකා බලන කල මන්දගාමී ස්වභාවයකින් සිදුවන්නේ,

(1) බුද්ධි වර්ධනය යි. (2) කායික වර්ධනය යි.
(3) චිත්තවේගී වර්ධනය යි. (4) සදාචාර වර්ධනය යි.
(5) සමාජ වර්ධනය යි.

**46.** යොවුන්වියේ දරුවන්ගේ කායික වර්ධනය පිළිබඳ වඩාත් නිවැරදි ප්‍රකාශය කුමක් ද?
(1) මල්වරවීම ගැහැනු දරුවන්ට සුවිශේෂී වූවකි.
(2) පශ්චාත් යොවුන් විය වයස අවුරුදු 20, 21දී අවසන් වේ.
(3) ගැහැනු, පිරිමි දෙපාර්ශවයේම මාංශ පේශී වර්ධනය වේගවත් වේ.
(4) පිරිමි සහ ගැහැනු දරුවන්ගේ අස්ථි මේරීම එකම වයසකදී අවසන් වේ.
(5) වයස අවුරුදු දොළහේදී පිරිමි දරුවන් ගැහැනු දරුවන්ට වඩා උසින් වැඩි ය.

**47.** මානසික පීඩනය සහිත පුද්ගලයකු පෙන්නුම් කරන චිත්තවේගීය ලක්ෂණ දෙකකි,
(1) අලස බව සහ හුදකලා වීම.
(2) නිශ්ක්‍රීය වීම සහ හුදකලා වීම.
(3) අලස බව සහ නින්ද නොයෑම.
(4) හුදකලා වීම සහ නින්ද නොයෑම.
(5) නිශ්ක්‍රීය වීම සහ නින්ද නොයෑම.

**48.** පුද්ගල සංවර්ධනය පිළිබඳ කරුණු කිහිපයක් පහත දැක්වේ.
A - ගතානුගතික චින්තනයෙන් මිදීමට උත්සාහ කරයි.
B - අනුකරණය කිරීමට පෙළඹෙයි.
C - අදහස් හා ගැටලු හුවමාරු කර ගනියි.
D - ආත්මාර්ථකාමී හැසිරීම් ප්‍රදර්ශනය කරයි.
මේවායින් යොවුන්විය හා සම්බන්ධ කරුණු වනුයේ,
(1) A සහ C පමණි.
(2) B සහ C පමණි.
(3) A, B සහ C පමණි.
(4) B, C සහ D පමණි.
(5) A, B, C සහ D සියල්ල ම.

**49.** ව්‍යවසායකත්වයට අදාළ ප්‍රධාන කාර්යයක් වනුයේ,
(1) සර්ව සුබවාදී වීමයි.
(2) නව අදහස් පිළිගැනීමයි.
(3) අත්දැකීම්වලින් ඉගෙනීමයි.
(4) ඉහළ ඉලක්ක පිහිටුවා ගැනීමයි.
(5) ව්‍යාපාර අවස්ථා හඳුනා ගැනීමයි.

**50.** පංචවිධ සංකල්පයට අයත්වන කරුණු දෙකක් වනුයේ,
(1) තේරීම සහ පිරිසිදු කිරීමයි.
(2) සැලසුම් කිරීම සහ තේරීමයි.
(3) සංවිධානය සහ මෙහෙයවීමයි.
(4) මෙහෙයවීම සහ පිරිසිදු කිරීමයි.
(5) සැලසුම් කිරීම සහ පිළියෙල කිරීමයි.

* * *

More Past Papers at
tamilguru.lk

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2021(2022)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2021(2022)
General Certificate of Education (Adv. Level) Examination, 2021(2022)

ගෘහ ආර්ථික විද්‍යාව II
மனைப் பொருளியல் II
Home Economics II

**28 S II**

පැය තුනයි
மூன்று மணித்தியாலம்
*Three hours*

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

**උපදෙස්:**

* **පළමුවන** ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න **හයකට** පිළිතුරු සපයන්න.

**1.** (i) අභ්‍යන්තර අවකාශ නිර්මාණකරණය යන්නෙන් අදහස් වන්නේ කුමක් ද?

(ii) පානීය ජලය ආරක්ෂිත වීම සඳහා තිබිය යුතු ගුණාංග **දෙකක්** සඳහන් කරන්න.

(iii) 'අසම්පූර්ණ ප්‍රෝටීන්' යන්න අර්ථ දක්වන්න.

(iv) තීව්‍ර මන්දපෝෂණය හඳුන්වන්න.

(v) ඇඟලුම් කර්මාන්තය ආශ්‍රිත කර්මාන්ත **දෙකක්** නම් කරන්න.

(vi) රෙදි පෙර පිරියම් කිරීම වැදගත් වන්නේ ඇයි? මේ සඳහා හේතු **දෙකක්** ඉදිරිපත් කරන්න.

(vii) විවේක ක්‍රියාකාරකම්වල ප්‍රතිලාභ **දෙකක්** ලියන්න.

(viii) 'ප්‍රතිචක්‍රීකරණය' හඳුන්වන්න. ඉන් ඇතිවන වාසි **දෙකක්** සඳහන් කරන්න.

(ix) මූලික සංවාදයක් ගොඩනැගීමට සුදුසු මාතෘකා **දෙකක්** සඳහන් කරන්න.

(x) දරුවකුගේ පෞරුෂ වර්ධනය කෙරෙහි බලපාන පූර්ව ප්‍රසව සාධක **දෙකක්** සඳහන් කරන්න.

(ලකුණු $02 \times 10 = 20$ යි.)

**2.** (i) භෞතික ජීවන පරිසරයට අයත් මූලික කොටස් **තුන** හඳුන්වන්න. (ලකුණු 03 යි.)

(ii) බාහිර අවකාශ නිර්මාණකරණයේදී සැලකිය යුතු සාධක **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි.)

(iii) වැසි ජලය සංරක්ෂණයේ ඇති ප්‍රයෝජන **හතරක්** ලියන්න. (ලකුණු 04 යි.)

(iv) ඔබගේ නිවසේ පසුගිය මස විදුලි බිල්පතෙහි අගය ඉහළ ගොස් ඇතැයි සිතා එය අවම කරගැනීම සඳහා ඔබ ගන්නා පියවර සාකච්ඡා කරන්න. (ලකුණු 06 යි.)

**3.** (i) ජලය මගින් සිරුරට ඉටුවන කෘත්‍ය **තුනක්** ලියන්න. (ලකුණු 03 යි.)

(ii) ආහාරවේල් සැලසුම් කිරීමේදී භාවිත කරන පහත සඳහන් මූලාශ්‍ර කෙටියෙන් පැහැදිලි කරන්න.

(a) නිර්දේශිත දෛනික පෝෂණ අවශ්‍යතා සටහන (RDA)

(b) පෝෂණ වගු (ලකුණු 04 යි.)

(iii) වයස්ගත වැඩිහිටියන්ගේ පෝෂණමය අවශ්‍යතා සපුරාලීමේදී සැලකිලිමත් විය යුතු කරුණු **හතරක්** ලියන්න. (ලකුණු 04 යි.)

(iv) ගර්භණී මවක් සඳහා දිනක බොජුන්පතක් සැලසුම් කරන්න. (ලකුණු 05 යි.)

[දෙවැනි පිටුව බලන්න.

**4.** (i) ක්ෂුද්‍රජීවීන්ගේ වර්ධනයට බලපාන අභ්‍යන්තර සාධක **තුනක්** ලියන්න. (ලකුණු 03 යි.)

(ii) සාමාන්‍ය සූර්යාලෝකයෙන් ආහාර වියළීමේ **අවාසි** පැහැදිලි කරන්න. (ලකුණු 04 යි.)

(iii) යෝගට් සෑදීමේ ක්‍රියාවලිය ගැලීම් සටහනක් ඇසුරෙන් ඉදිරිපත් කරන්න. (ලකුණු 04 යි.)

(iv) සුළු පරිමාණ යෝගට් නිෂ්පාදන ව්‍යාපාරයක තත්ත්ව පාලනය සඳහා අනුගමනය කළහැකි මනා කළමනාකරණ උපක්‍රමවලට (GMP) අදාළ කරුණු **පහක්** සාකච්ඡා කරන්න. (ලකුණු 05 යි.)

**5.** (i) මෝස්තර නිර්මාණය සඳහා තොරතුරු ලබාගත හැකි මූලාශ්‍ර **තුනක්** නම් කරන්න. (ලකුණු 03 යි.)

(ii) මේස දරණුවක් නිර්මාණයේදී අනුගමනය කළයුතු පියවර අනුපිළිවෙළින් දක්වන්න. (ලකුණු 05 යි.)

(iii) (a) මේස දරණුවක් අලංකාර කිරීම සඳහා සුදුසු මෝස්තරයක් අඳින්න.

(b) මෙම මෝස්තරය මැසීමේදී,

- යොදන මැහුම් ක්‍රම
- තෝරාගන්නා වර්ණ සහ
- එම මැහුම් ක්‍රම යොදන ස්ථාන

ඉදිරිපත් කරන්න. (ලකුණු 08 යි.)

**6.** (i) 'ක්‍රියාකාරී ආහාර' යනුවෙන් කුමක් අදහස් වේ ද? (ලකුණු 02 යි.)

(ii) ඖෂධීය ශාක වර්ග **හතරක්** නම් කර, ඒ එකිනෙකෙහි ප්‍රයෝජනය බැගින් ලියන්න. (ලකුණු 04 යි.)

(iii) (a) සංචාරක ආකර්ෂණ වර්ග කර දක්වන්න.

(b) ඉහත (a) හි සඳහන් එක් එක් වර්ගය සඳහා උදාහරණ **දෙක** බැගින් ලියන්න. (ලකුණු 04 යි.)

(iv) 'සියලුම ගමන් බිමන් සංචරණ ලෙස හැඳින්විය නොහැක.' විමසන්න. (ලකුණු 06 යි.)

**7.** (i) නව යොවුන්වියේ සිදුවන බුද්ධි වර්ධනය පිළිබිඹු කරන හැකියා **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි.)

(ii) වර්තමානයේ දරුවා අධ්‍යාපනය හා සම්බන්ධව මුහුණ දෙන ගැටලු **හතරක්** ලියන්න. (ලකුණු 04 යි.)

(iii) නව යොවුන්වියේ දරුවන්ගේ මානසික නිරෝගීතාව වර්ධනය සඳහා පාසල මගින් ගතයුතු ක්‍රියාමාර්ග පැහැදිලි කරන්න. (ලකුණු 04 යි.)

(iv) යොවුන් දරුවන් යහමග යැවීම සඳහා පවුල සතු කාර්යභාරය සාකච්ඡා කරන්න. (ලකුණු 05 යි.)

**8.** පහත දැක්වෙන මාතෘකා අතුරෙන් **හතරක්** පිළිබඳව කෙටි සටහන් ලියන්න.

(i) නිර්මාණකරණයේදී භාවිත කරන වර්ණ

(ii) ස්ථූලතාව නිසා ඇති වන සෞඛ්‍යමය ගැටලු

(iii) නිමි ඇඳුම් කර්මාන්තයේදී භාවිත වන 100 වර්ගයට අයත් මැහුම්

(iv) කොවිඩ් 19 වසංගතය හේතුවෙන් ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයට ඇති වූ බලපෑම

(v) ඉහළ (ධන) ස්වසංකල්පයකින් යුක්ත දරුවෙකු තුළ පවත්නා ලක්ෂණ

(ලකුණු 04 × 4 = 16 යි.)

* * *

More Past Papers at
tamilguru.lk